# බෙදවාචකයේ දැනුමෙන් දැනුමේ බෙදවාචකයට

පසුගිය සතියේ මෙරට වැසියන්ගෙන් සුනාමි යන ජපන් වචනය දැන සිටියේ ජපානයට ගොස් ඇති අය හා භූවිද්‍යාව, භූගෝල විද්‍යාව, කාලගුණ විද්‍යාව හැදෑරූ අතළොස්සක් විය හැකි ය. එහෙත් මහාමාරියාව වැනි අර්ථයක් ගෙන දෙන සුනාමිය යන්න අද නොදන්නා අයකු නැති තරම් ය. එහෙත් වචනය දැදැනසිටිය ද සිදු වී ඇත්තේ කුමක් ද යන්න පිළිබඳ ව අවබෝධයක් විශේෂඥයන් ලෙස මාධ්‍ය ඔස්සේ ජනතාව හමුවට පැමිණෙන ඇතැමුනට ද නැති බව පැහැදිලි ය. මෙදා සුනාමිය ඇති වී තිබෙන්නේ භූමිකම්පාවක ප්‍රතිඵලයක් වශයෙන් යැයි කියැවෙයි. එහෙත් සුනාමියක් ඇතිවීමට භූමිකම්පාවක් ම අවශ්‍ය නොවන බව පැහැදිලි කරගත යුතු ය. උල්කාපාතයක් මහමුහුදට  වැටීමෙන් පමණක් නොව මහමුහුදෙහි න්‍යෂ්ටික බෝම්බ පිපිරවීමකින් ද සුනාමියක් ඇතිවිය හැකි බව බටහිර විද්‍යාඥයෝ ම පවසති. සුනාමියක් ඇතිවන්නේ ආවේගී බලයක් (ඉම්පල්සිව් ෆෝර්ස් - ඉතා කෙටි කාලයකදී ඇතිවන අති විශාල බලයක්) මුහුදු ජලය මත ක්‍රියාකිරීම හේතුවෙන් ය. මුහුදෙහි භයංකර විපත් ගෙන දියහැකි සැඩ තරංග ඇතිවන්නේ ආවේගී බලය හේතුකොටගෙන යැයි බටහිර විද්‍යාඥයෝ කියති. ඒ සඳහා භූමිකම්පාවක් සිදුවීම අනිවාර්ය නො වෙයි. සැඩ ජල තරංග භූ තරංග සමග පටලවා ගත යුතු නොවන බව ඇතැම් විශේෂඥයන්ට ද අමතක වුවා සේ ය. කෙසේ වෙතත් පසුගිය ඉරිදා සුනාමිය ඇතිවූයේ භූමිකම්පාවක් නිසා යැයි බටහිර විද්‍යාඥයෝ කියති. එය එසේ විය හැකි ය. එහෙත් ඒ එසේමදැයි අපට ම දැනගැනීමට තරම් දැනුමක් අපට වේ ද? අර කිසිවකු කී පමණින් නො පිළිගත යුතු ය යනුවෙන් කාලාම සූත්‍රයෙහි සඳහන්වන්න අපට අමතක ද?

ඒ කෙසේ වෙතත් අපේ රටේ මෑත ඉතිහාසයේ ඇති වූ විශාලතම ස්වාභාවික ආපදාවෙන් මුළු රටම මළගෙයක් බවට පත් වී ඇත. මෙවැනි සිද්ධියක් කැලණිතිස්ස රජු දවස ද ඇති වූ බව මහාවංශයෙහි සඳහන් වෙයි. එහෙත් මහාවංශයෙහි සඳහන් දේ පිළිගන්නෝ කවුරුහු ද? අඩුතරමින් එකල ග්‍රීක ඉතිහාසඥයකුවත් ඒ ගැන සඳහන්කර තිබී නම් පිලිගැනීමට තිබුණි. බණ පොතේ මෙවැනි විපත්ති ගැන සඳහන් වෙයි. ඉතා උසට නැගි ජලකඳන් මුහුද ගොඩ ගැලීම් වැනි සිද්ධි මහාවංශයෙහි හෝ බණපොතේ හෝ සඳහන් වූ පමණින් පිළිගත යුත්තේ ඇයි? පැරණි ග්‍රීකයකු බැරිනම් රෝමකයකු එවැන්නක් කියා ඇත්දැයි සොයා බැලිය යුතු ය.

මුළු රටම කම්පා වී සිටින අවස්ථාවක මෙවැන්නක් ලිවීමට මට සිතෙන්නේ මා ද මේ ව්‍යසනයෙන් කම්පාවට පත් වී ඇති බැවින් මිස ඇනුම්පද කීම සඳහා නො වෙයි. මියගිය දසදහස් ගණනක් වූ උතුරේ ද දකුණේ ද නැගෙනහිර ද බටහිර ද ජනතාව ගැන අනාථ වූ දරුවන් ගැන රටට වූ විපත්තිය ගැන මම ද හදවතින් වැළපෙමි. බටහිර කාන්තා විමුක්තිය ගැන කතාකිරීමට අවුරුදු දහස් ගණනකට පෙර මෙරටට සඟමිත් මෙහෙණින් වහන්සේ වැඩම කළ උඳුවප් පොහෝ දිනක අපි තම දරුවන් ස්වාමි පුරුෂයන් දෙමව්පියන් අහිමි වූ නූතන පටාචාරාවන් ගැන ඇසුවෙමු. සොහෙනෙහි බැඳි සෝපාකලාට අත් වූ ඉරණමට වඩා භයානක ඉරණමකට ගොදුරු වූ පුංචි සෝපාකලා අපි රූපවාහිනියෙන් දුටුවෙමු. ඒ සියල්ල මැද නො වැළපෙන හදවතක් ඇතැයි නො සිතිය හැකි ය. එහෙත් අද පටාචාරාවන්ට සෝපාකලාට පිහිටවීමට මහාකාරුණික බුදුහිමියන් නැත. අද ඇත්තේ බුෂ් ය. අපි සියල්ලෝ ම අසරණ වී සිටිමු. අපට අද අවසාන වශයෙන් ගත්කල ඇත්තේ ද බටහිරයන්ගේ ම සරණ වීම ගැන අපට කුමක් සිතෙන්නේ ද? එහෙත් ඔවුන් අපට දෙන්නේ ද සොච්චම් මුදලක් බව ද අමතක නොකළ යුතු ය.

එදා විහාර මහා දේවිය රට වෙනුවෙන් බිලි වීමට ඉදිරිපත් වුවා ය. එදා ඇය බිලිවනු කැමරාවට හසුකරගැනීමට ඡායාරූප ශිල්පීහු නොසිටියහ. අද විහාර මහා දේවිය නැත. කැමරාකරුවෝ නම් සිටිති. හෙලිකොප්ටර්වල මැති ඇමතිවරුන් සමග කැමරාකරුවෝ ද යති. අපේ නායක නායිකාවන්ට තම විදේශ සංචාර නතරකර ආපසු ඒමට ද දින දෙක තුනක් ගතවිය. ඒ ඇතැම් විට ගුවන්යානයක් සොයාගැනීමට වූ අපහසුව නිසා විය හැකි ය. මේ කසිකබල් දේශපාලනඥයන් ගැන කතාකිරීම පවා කාලය කා දැමීමකි.

එහෙත් අපේ අසරණකම ගැන කතාකළ යුතු ය. ඒ ඉදිරියේ දී හෝ අපට ස්වාධීනවීම සඳහා මිස වෙනත් කරුණක් සඳහා නො වෙයි. සුනාමිය ගැන දැනුම ඇත්තේ අපට නොව බටහිරයන්ට ය. අපට ඒ පිළිබඳ අපේ දැනුමක් තිබෙන්නට ඇත. එහෙත් ඒ කුමක්දැයි අපි නො දනිමු. මෙරට එක්තරා මහතකු කලකට පෙර මෙවැනි විපතක් පිළිබඳ

© Prof. Nalin De Silva

අනාවැකියක් පළකෙළේ යැයි කියැවෙයි. ඔහු ඒ කෙළේ කෙසේ දැයි අපි නොදනිමු. අඩුම තරමින් ඒ ගැන සොයාබැලීමටවත් අපට අවශ්‍ය නො වෙයි. අපේ මිනිසුන්ට ඇත්තේ මිථ්‍යා දැනුමක් පමණක් ය යන පූර්ව නිගමනයෙහි අපි සිටිමු. මෙරට මිනිසුන් දන්නා විද්‍යාත්මක ක්‍රමවේදය කුමක්දැයි බටහිර විද්‍යාව පොතපතින් හා දැන් අන්තර්ජාලයෙන් අහුලාගත් විශේෂඥයකු කීමට බැරි කමක් නැත. එහෙත් ඊනියා විද්‍යාත්මක විධික්‍රමයක් නොමැති බව මේ විශේෂඥයෝ නොදනිති. ඊනියා විද්‍යාත්මක විධික්‍රමය යන්න ද බටහිරයන් තම දැනුම් ආධිපත්‍යය පැතිරවීම සඳහා නිර්මානය කර ඇති තවත් මගඩියක් පමණකි.

සුනාමි භූමිකම්පා ගැන දන්වන ජාලයක් ඉන්දියන් සාගර කලාපයේ නැතැයි දැන් හෙළිවෙයි. එහෙත් එවැනි ජාල ශාන්තිකර සාගර කලාපයේ ඇතැයි කියැවෙයි. ඉන්දියන් සාගර කලාපයේ එවැන්නක අවශ්‍යතාව ගැන බටහිර විද්‍යාඥයන්ට කල්පනාවක් තිබී නැත. ඔවුන් අද ඒ සඳහා විවිධ හේතු දෙනු ඇත. එහෙත් ප්‍රධාන හේතුව ඒ එකක්වත් නො වෙයි. ඉන්දියන් සාගර කලාපයේ බටහිරයන් නොමැතිවීම එයට ප්‍රධාන හේතුව වෙයි. එංගලන්තයෙන් පිටමංකළ හිරකරුවන් ඕස්ට්‍රේලියාවේ පදිංචි නොකර මලයාසියාව හා අසල රටවල පදිංචි කර තිබිණි නම් අපට ද සුනාමියෙන් වූ විපත් යම් ප්‍රමාණයක් හෝ මගහැර ගැනීමට තිබිණි. ඇතැම්විට කිසිම විපතක් නොවීමට ද තිබුණි.

පල්ලෙකැලේ භූවිද්‍යා ආයතනයක සුනාමියට මුල් වූයේ යැයි කියන භූමිකම්පාව වාර්තා වුව ද එහි වගකිවයුත්තන් ඒ පිළිබඳ කිසිවක් නොකෙළේ යැයි චෝදනාවක් නැගෙයි. එහෙත් එලෙස චෝදනාකිරීම සාධාරණ නො වෙයි. ප්‍රශ්නය වනුයේ ඒ අයට වාර්තා වූ දත්ත සුනාමියක් සමග සම්බන්ධකිරීමට තරම් දැනුමක් වී ද යන්න ය. දත්ත, දත්ත වන්නේ තමන්ගේ දැනුමේ ප්‍රමාණයට ය. මතවාදයකින්, ප්‍රවාදයකින් (ප්‍රවාද ද මතවාද වෙයි) තොරවූ දත්ත හා පරිසිද්ධි (ෆැක්ට්ස්) ඇත්තේ බටහිර විද්‍යාව පිළිබඳ දාර්ශනිකයන් ලියන පොත පතෙහි පමණ ය. පරිසිද්ධි පූජනීය වේ යන තේරුම ඇති ෆැක්ට්ස් ආර් සේක්රඩ් යන ඉංගිරිසි කියමන බටහිරයන්ගේ තවත් මගඩි කියමනක් පමණකි. පරිසිද්ධිවල කිසිම පූජනීයත්වයක් නැත. පරිසිද්ධි ද විවරණයට යටත් වෙයි. මෙරට භූවිද්‍යාඥයන්ගෙන් කී දෙනකුට සුනාමි පිළිබඳ මනා අවබෝධයක් ඇත් දැයි මම නො දනිමි. අප දන්නේ බටහිරයන්ගේ දැනුමෙන් ඉතා සීමිත ප්‍රමාණයක් බවත් එය ද බොහෝ විට ඔවුන් දෙන ප්‍රමාණයට බවත් සාමාන්‍ය ජනතාව නොදනිති. අර ජාලය නොමැති වුවත් සුනාමි ගැන දන්නා බටහිරයන් මේ කලාපයේ කිසිම රටකට ඒ ආවේගය වාර්තාවීමෙන් පසුව ඒ ගැන දැන්වීමට අඩුම තරමින් උත්සාහයක් ගෙන ඇත් ද?

අප බටහිර දැනුම් ආධිපත්‍යයෙන් පීඩාවිඳින බව අපි නොදනිමු. අපට දැන් සුනාමි ජාලයක් ලැබෙන්නට ඉඩ ඇත. එහෙත් අප සිටින්නේ එහි පරිධියෙහි මිස මැද නො වෙයි. අප කලාපයට අපේ ම වූ ජාලයක් නිර්මානයකිරීමට කෙතරම් කලක් ගතවේ ද? මේ සියල්ලෙන් මා කියන්නට බලාපොරොත්තුවන්නේ බටහිර දැනුම අප සතුව ඇත්තේ ඉතා සීමිත ව බවත් එහි ආධිපත්‍යය අපට නැති බවත් දැනුම ඔස්සේම බටහිරයන් අප තලා පෙලන බවත් ය. අපට කිසි දිනෙක ඔවුන් සතු මුළු දැනුම ලබාගත නො හැකි ය. ඉන්දියාවට වුව ද එය අසීරු වෙයි. අප බටහිරයන්ගේ ද දැනුම අපට අවශ්‍ය ආකාරයට අවශෝෂණය කරමින් අපේ දැනුමක් වහා වර්ධනය කරගත යුතු ය.

දොඩන්දූවේ කුමාරකන්ද පන්සලේ හාමුදුරුවරුන්ට එදා පෝදා උදේ මුහුද දෙස බලා යම් විපත්තියක් සිදුවන්නට යන බව දැනගැනීමට හැකිවිය. උන්වහන්සේලා පන්සල අවට ජනයා පන්සල පිහිටි කන්දට ගෙන්වාගැනීමෙන් ඒ ජීවිත සියල්ල බේරාගෙන ඇත. ඇතැම් වනසත්තු වීමට යන විපත්තිය කල්තබා දැනගත් බව උන් හැසිරී ඇති ආකාරයෙන් පෙනී යයි. අද අප උගතුන් යැයි කියන්නන්ට සමස්තය දෙස බලා නිගමනවලට පැමිණීමේ හැකියාව නැත. බටහිරයන් නිගමනවලට පැමිණෙන්නේ වැඩිපුරම කුඩා කොටස්වලට කඩා කරන විශ්ලේෂණයකිනි. අපට ඒ දැනුම ද නැත. බටහිරින් ගත් අපේ ආචාර්ය උපාධිවල ඇත්තේ සුළු දැනුමක් බව නොකියාම බැරිය. අපේ අසරණබව පෙනී යන්නේ මෙවැනි විපත්තියකින් පසුව ය. මේ ප්‍රශ්නයෙහි දී පමණක් නොව මෙරට ප්‍රධාන ප්‍රශ්නයෙහි දී ද අප දැනුම ලබාගන්නේ බටහිරින් ය. ඊනියා ජාතික රාජ්‍යය, ජාතිය, ස්වයංනීර්ණය ආදී සංකල්ප අප ව්‍යසනයකට ඇද දමා ඇත. අපි අද අන්තර්ජාලය, තොරතුරු තාක්ෂණය ආදිය යොදාගනිමු. එහෙත් ඒ දැනුම ලබාගැනීමට මිස දැනුම ලබාදීමට නොවේ. අප අන්තර්ජාලයේ වහළුන් මිස ස්වාමීන් නොවන බව අමතක නොකළ යුතු ය.

© Prof. Nalin De Silva